

# නිර්මාණාත්මක සන්නිවේදනය

කෞශල්‍යා ගම්ලත්








- මිනිසා ස්වභාවයෙන්ම නිර්මාණශීලී සත්වයෙකි.

**නිර්මාණයක් යනු :**
අපූර්වත්වයකින් යුතුව නිපදවනු ලැබූ පෙර නොවූවිරූ දෙයක්

නිර්මාණශීලිත්වය යනු: “යම් නිමැවුමක් සදහා පරිකල්පනය හෝ අපූර්ව අදහසක් භාවිත කිරීම“

ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය





SPACEX

- **නිර්මානාත්මක සන්නිවේදනය යනු:**

යම් සන්දේශයක් ග්‍රාහකයාට වඩාත් සමීපව වැටහෙන ලෙස ප්‍රකාශ කිරීමයි.





“යමෙකු යම් වේදිතයක් විදගැනීමෙන් පසු චලන, රේඛා, වර්ණ, ශබ්ද, හෝ වචන සංයෝග මගින් ඒ වේදිතය ඒ අයුරින්ම අනායන් තුළ දැනවීම කලාවයි.”

(ලියෝ ටෝල්ස්ටෝයි)

# නිර්මාණාත්මක සන්නිවේදනයේ ඉතිහාසය

- ප්‍රාග් ඓතිහාසික යුග වල පටන් මිනිසා නිර්මාණාත්මක කාර්යන්හි යෙදීම
- මිනිසා ශිෂ්ටාචාර ගත වෙත්ම ඔවුන් යොදාගත් සන්නිවේදන ක්‍රම ගායනය , වාදනය , නර්තනය ආදී කලා කෘති බවට පත්වීම
- 14-17 සියවස් අතර ලෝකයේ මධ්‍යකාලීන කලා කෘති නවීනත්වයට පත්වීම
- කාර්මික විප්ලවයෙන් පසු ජනමාධ්‍ය බිහිවීමත් සමග නිර්මාණාත්මක සන්නිවේදනය මිනිසාගේ දෛනික ජීවිතය හා ඉතා සමීප වීම
- නූතනයේ ශ්‍රව්‍ය දෘශ්‍ය විවිධ මාධ්‍ය ප්‍රවර්ග බිහිවීමෙන් ඒ ඒ වර්ග අනුව විවිධ මාධ්‍ය සංස්කෘතීන් වර්ධනය වීම

# නිර්මාණාත්මක සන්නිවේදනයේ ස්වභාවය

1. ප්‍රකාශිත අර්ථය ඉක්මවා ගිය රසවිදින්නට යමක් ඇති බව
2. යම් හැගීමක්, අදහසක්, සිතිවිල්ලක්, තොරතුරක් අපූර්ව ලෙස ඉදිරිපත් කිරීම
3. හුදෙකලා දෙයක් නොව පාරිසරික හා සන්නිවේදන සබඳතා සහිත එකක් වීම
4. කලාව හා දැඩිව සම්බන්ධ වීම
5. මානව සංස්කෘතිය නිර්මාණය කිරීම
6. නවෝත්පාදනය ( අළුත් අදහස් මතුවීම)

- **නිර්මානාත්මක සන්නිවේදනය හා සාර සන්නිවේදනය.**

"වඩාත් යහපත් ප්‍රතිචාර ලබා ගැනීම යනු මාධ්‍ය භාවිතයේ අර්ථ සිද්ධියයි. මේ සංකල්පය සන්නිවේදකයා පළමුව හදුනාගන්නේ කිසියම් සමාජයක අවශ්‍යතාවයක් මුදුන් පමුණුවා ගැනීමක් වශයෙනි. දෙවනුව ඒ අවශ්‍යතාවයේ මහිමය අන් අයටද හදුනාගත හැකිය. මේ **නිර්මාණාත්මක රීතිය** සන්නිවේදන අධ්‍යනයේදී සාර සන්නිවේදනය හෙවත් නිර්මාණාත්මක සන්නිවේදනය ලෙස හැදින්වේ. ඒ සදහා කිනම් බසකින් ඇමතුවද කවරාකාර සමාජයක විසුවද එහි විශ්ව සාධාරණ ගුණයක් ඇත." (සුනන්ද මහේන්ද්‍ර)

**නිර්මාණාත්මක රීතිය** : වඩාත් යහපත් ප්‍රතිචාර ලබා ගැනීමට මාධ්‍ය භාවිතය හෙවත් සමාජයීය අවශ්‍යතාවක් හඳුනාගෙන එහි අවශ්‍යතාව අන් අයටද ඇතිකිරීම

**සාර සන්නිවේදනය** : සමාජයීය අවශ්‍යතා සඳහා නිර්මාණාත්මක සන්නිවේදනය භාවිත කිරීම

## නිර්මාණශීලීත්වය හා සන්නිවේදනය අතර අවියෝජනීය සබඳතාවය

**යමක් කෙතරම් නිර්මාණශීලීව ඉදිරිපත් කරන්නේද ඒ තරමටම එයින් අපේක්ෂිත පරමාර්ථ ද ඉටු වීම**

# නිර්මාණාත්මක සන්නිවේදනයේ වැදගත්කම



ජේම්ස් වොට්සන්

(සන්නිවේදන අධ්‍යනය යනු කුමක්ද කෘතිය)

නිර්මාණාත්මක සන්නිවේදනය මගින් කරුණු 10 ක් ඉටුකරගත හැකි බව

1. ගැටළු විසදාගැනීමට හේතු වේ
2. පෙළඹවීමක් ඇතිකරයි
3. උද්‍යෝගීභාවයකින් යුතු ක්‍රියාශීලීත්වයක් ඇති කරයි
4. අදහස් පණ ගැන්වීමට උපකාරී වේ
5. පවතින දෙයක් කෙරෙහි අභියෝගයක් ඇති කිරීමට හේතු වේ.

6. ගවේශනාත්මක බව ඇතිකරයි
7. කණ්ඩායම් කටයුතු වලට වැදගත් වේ
8. සෙසු අයගේ නිර්මාණශීලීත්වය අගය කිරීමට
9. නිර්මාණශීලීත්වය විවෘතය, නම්‍යශීලීය
10. කායි තෘප්තියක් ඇතිකරයි

# නිර්මාණශීලීත්වයේ මූලිකාංග වටහාගැනීමට අවශ්‍ය සංකල්ප

01. නිර්මාණය
02. නිර්මාණශීලීත්වය
03. නිර්මාණාත්මක චින්තනය
04. නිර්මාණ ශිල්පියා
05. නිර්මාණාත්මක රචනය

# 01. නිර්මාණය

**පෙර නොවූ විරූ දෙයක්, අපූර්ව දෙයක්(නවෝත්පාදනය/මැවීම)**

**ඒ සඳහා අවශ්‍ය දෑ**

**පුද්ගලයෙකුගේ කලාත්මක හැකියා, කුසලතා, ප්‍රබලතා, ප්‍රතිභාව, පරිකල්පනය , ව්‍යුත්පත්තිය, සතතාභ්‍යාසය, බහුශ්‍රැතභාවය දාර්ශනික සංකල්පනා**

<u>නිර්මාණය</u> යන්නෙන් අදහස් වන්නේ පෙර නොවූ විරූ යන අදහසයි. ඊට නවෝත්පාදනය යැයිද කිව හැකිය. නිර්මාණයක් යනු තිබෙන හෝ පවතින යමකට වඩා වෙනස් වූ නව බිහිකර ගැනීමකි. නිර්මාණය හෝ නිර්මාණ යන්න ශබ්ද කෝෂාර්ථයට අනුව නම් මැවීම, සැදීම වශයෙන් හඳුන්වා දිය හැකිය. (සුනන්ද මහේන්ද්‍ර )

“නිර්මාණය යනු අලුත් යමක් නිපදවීමේ ක්‍රියාවලියයි.” (ක්‍රිෂ්ණ මූර්ති)

"නිදහසින් තොරව නිර්මාණයක් නැත”
ඔක්ස්ෆර්ඩ් ශබ්දකෝෂය

“නිර්මාණයක ආරම්භය පරිකල්පනයයි”
(බර්නාඩ් ෂෝ)

# 02. නිර්මාණශීලීත්වය

නිර්මාණශීලීත්වය යනු නිර්මාණයක් බිහිකිරීමෙහි ලා නිර්මාණකරුවකු සතු හැකියාව හෝ ශක්තියයි. එය එම පුද්ගලයා සතු ප්‍රතිභාව ( අන්තර්ඥානය / ප්‍රතිභානය) ලෙස හඳුන්වන අතර එය සහජයෙන් එන වාසනා ගුනයකි.

"නිර්මාණශීලීත්වය යනු නව දේවල් සිතීමයි." (තියඩෝර් ලෙවිට්)

"නිර්මාණශීලීත්වය පැණ නගින්නේ සවිඥානික යථාර්ථය හා අවිඥානික ධාවකය අතර ආතතියෙනි."
සිග්මන් ෆ්‍රොයිඩ්

නිර්මාණශීලීත්වය යනු අලුත් යමක් නිපදවීම නොව සොයා ගැනීමෙන් පසු එයින් යමක් සෑදීමයි ( ජේම්ස් රසල් ලොවෙල්)

# නිර්මාණශීලීත්වයේ මූලකාංග අඩංගු කරුණු 7 ක් (ලියනාඩෝ ඩාවිංචි)

01 දුර්ලභත්වය/ කුතුහලය
02. සුවිදර්ශකය/ නිරූපණය
03. සංවේදනය
04. සාධුගමනය/ මෘදු භාවය
05. කලා විද්‍යා තුල්‍යතාවය
06. කායික මානසික තුල්‍යතාවය
07. සම්බන්ධතාවය

# නිර්මාණශීලීත්වයේ මූලිකාංග

- ඉන්ද්‍රිය සංවේදනය ( පංචේන්ද්‍රයන්ට වන දැනීම)
- පරිකල්පනය (පුද්ගල මනසේ චිත්ත රූප මැවීම)
- ප්‍රත්‍යක්ෂනය( අවබෝධ කර ගැනීම)
- සංජානනය( ( පංචේන්ද්‍රයන්ට අනුව යම්ස්ක් අවබෝධ කර ගැනීම)
- අත්දැකීම් ප්‍රතිවින්දනය ( අත්දැකීම් නැවත විඳීම)
- ප්‍රස්තුත ගවේශනය(විවිධ කරුණු ගැඹුරින් අධ්‍යනය)
- සතතාභ්‍යාසය( නිරන්තරයෙන් අභ්‍යාසයේ යෙදීම)
- ශිල්පීය කුසලතා (විවිධ ශිල්පයන්හි භාවිත වන කුසලතා)

මෙම ලක්ෂණ සන්නිවේදකයෙකුට බෙහෙවින් වැදගත් වන අතර ඔහු තුළ පහත සදහන් නිර්මාණශීලීත්වයේ මූලික ලක්ෂණ දැකිය හැක.

- පෙර නොවූ විරූ අයුරින් ලෝකය සංජානනය කිරීමේ හැකියාව
- සැගවුණු රටාවන් හදුනාගැනීමේ හැකියාව
- බැලූ බැල්මට සබදතාවක් නොපෙනෙන ප්‍රපංච අතර සබදතා ගොඩනගාගැනීම හා විසදුම් උත්පාදන හැකියාව

# 03.නිර්මාණාත්මක චින්තනය

නිර්මාණකයක් යනු නිර්මාශීලී පුද්ගලයෙකුගේ ආත්ම ප්‍රකාශනයකි

නිර්මාණකරුවා තම නිර්මාණයේ වස්තු විෂය උකහා ගන්නේ සිය ජීවන අත්දැකීම් හරහාය.
එම අත්දැකීම් ඔහුට ලැබෙන ප්‍රධාන ආකාර 3 කි.

- ස්ව අත්දැකීම්
- අන්‍යන්ගෙන් ලැබෙන අත්දැකීම්
- මාධ්‍ය හෝ වෙනත් අත්දැකීම්

## <u>නිර්මාණාත්මක චින්තනය සරලව:</u>

ලෝකය අපූර්ව ලෙස දැකීමටත් මානසික සබඳතා හා පාරිසරික ක්‍රියාවලිය අපූර්ව ලෙස ප්‍රතිනිර්මාණය කිරීමටත් යොදා ගන්නා මානසික ශක්තියයි. එය මෙහෙය වන්නේ <u>පරිකල්පනය</u> තුළිනි.

<u>පරිකල්පනය</u> යනු: නිර්මාණ කාර්‍ය සඳහා අවශ්‍ය සංකල්ප චිත්ත රූප ගොඩ නගා ගනු පිණිස නිර්මාණකරු සතු ශක්තියයි.

# නිර්මාණාත්මක චින්තනයට අවශ්‍ය සාධක

- පරාවර්තතාව: විනිවිද පෙනෙනෙ පැහැදිළි මනසක් තිබීම
- විවේචනාත්මකතාව: නරක දැකීම
- විශ්ලේෂණාත්මකතාව: හොද නරක ලෙස කොටස් කර ඇගයීම

# <u>බ්‍රිතාන්‍ය ජාතික ග්‍රැහැම් වෝල්ස් ට අනුව නිර්මාණාත්මක චින්තන ක්‍රියාවලියේ අදියර</u>

- <u>සකස් කිරීම</u>: ප්‍රස්තුතය සවිඥානිකව හා ක්‍රමාණුකූලව විමර්ෂණය
- <u>පෝෂණය</u>: ප්‍රස්තුතය පිළිබඳව අවිඥ්ඥානිකව සිතීමෙන්න් වැළකීම නිසා පෝෂණය
- <u>ප්‍රදීපනය</u>: නිර්මාණශීලී අදහස පිළිබඳ හදිස්සියේ ඇතිවන ආවේශ මගින් බිහිවන තත්වය
- <u>සත්‍යාපනය</u>: නව අදහසේ වලංගුභාවය පරීක්ෂා කර නිශ්චිත ආකෘතියකට ගැනීම. *The art of Thought*

# 04. නිර්මාණ ශිල්පියා

- නිර්මාණයේ නිමැවුම්කරුවා
- "යම් දෙයක් සැදූ හෝ නිපදවූ පුද්ගලයා"- ඔක්ස්ෆර්ඩ් ශබ්ද කෝෂය
- ඕනෑම පුදගලයෙකු යම්කිසි නිමාණ ශක්තියක් සතුව ඉපදී ඇති නමුත් සෑම පුදගලයෙකුටට නිර්මාණ කරුවෙකු විය නොහැක. එය දීර්ඝ කාලීනව වර්ධනය කර ගත යුතු දෙයකි.

# 05. නිර්මාණාත්මක රචනය

- කිනම් හෝ ශෛලියකින් රචකයෙකු විසින් නිර්මාණශීලී මනසකින් ලියනු ලැබූ ලේඛනයකි
- නිර්මාණශීලී රචනයෙන් අරමුණ වන්නේ රසිකයාට සිතිවිළි, හැඟීම් හා රසභාව පූර්ණ චිත්ත තත්වයක් ඇතිකිරීමයි.
- නිද: කවිය, ගීතය, නවකතා, කෙටි කතා, තීරු ලිපි, වෙළෙඳ දැන්වීම්

# නිර්මාණාත්මක රචනයේ ලක්ෂණ

- යොදාගන්නා භාෂාව රසවත් ය
- භාෂාව ව්‍යංගාර්ථ පූර්ණය
- පරිකල්පනය පුබුදු කරවන සුළුය
- පාඨක සිත් සතපවන සුළුය
- සංවේදිතා ඇති කරයි ( සිනහව, ප්‍රහර්ෂය, සංතාපය)